# සාරාංශය

පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායේ එන සංඛ්‍යා සංකල්ප ශ්‍රී ලංකාවේ පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියේ ළමයින් සඳහා ඇති අදාලත්වය ( පශ්චාත් පිපියාතු මත හා පර්යේෂණ ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනයකි. )

සංගහනය ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර කොට්ඨාශයයි. නියැදිය ලෙස එම කොට්ඨාශයට අයත් සියළු පෙර පාසැල් වල අවුරුදු හතර පහ වයසේ ළමයින්ගෙන් අහඹු ලෙස තිස් දෙනෙක් තෝරා ගෙන ඇත. පර්යේෂණ ක්‍රමය ලෙස යොදා ගත්තේ පියාජේ භාවිතා කළ හරස් කඩ අධ්‍යයන ක්‍රමයයි.

ප්‍රජානන සංවර්ධනය සම්බන්ධ පියාජේගේ න්‍යායේ සඳහන් සංකල්ප පිළිබඳ ප්‍රජානනය ශ්‍රී ලංකාවේ ළමුන් තුළ කුමන මට්ටමක පවතීද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය විය. ඒ අනුව අරමුණු මෙසේ දැක්විය හැකිය.

1. තෝරා ගන්නා ලද නියැදියේ සංඛ්‍යා සංකල්ප පිළිබඳ ප්‍රජානන මට්ටම කුමක්දැයි සෙවීම.

   1.1 ළමයින්ට එකේ සිට දහයට කට පාඩමින් ගණන් කිරීමේ හැකියාව තිබේද ?

   1.2 එකට එක අනුරූපතාවය අනුව යම් ද්‍රව්‍ය දෙවර්ගයක් සමාන්තර පේළි දෙකකට පෙළ ගැස්වූ විට සමාන සංඛ්‍යාවක් තිබෙන බවට නිවැරදිව පිළිතුරු දෙනවාද යන්න සෙවීම

   1.3 යම් ද්‍රව්‍ය සංඛ්‍යාවක් කුමන ආකාරයකට පෙළ ගැස්වූවත් එම සංඛ්‍යාවේ වෙනස් නොවන ගුණය පිළිබඳ වැටහීමක් තිබේදැයි සෙවීම.

   1.4 පේළි වල ද්‍රව්‍ය සංඛ්‍යාව වැඩියෙන් තිබෙද්දී සංඛ්‍යා සංකල්ප පිළිබඳ සංරක්ෂණ නොමැති වූවත් ද්‍රව්‍ය සංඛ්‍යාව තුන දක්වා අඩු වූ විට සංරක්ෂණ හැකියාව තිබේදැයි සෙවීම.

   1.5 මෙම නියැදියේ ළමයින්ට ක්‍රමාංක සංඛ්‍යා සම්බන්ධතාවය දක්වන (Ordinal Principal ) පළමුවැනි, දෙවැනි යන පද භාවිතා කළ හැකිද යන්න සෙවීම.

   1.6 දෙකකට තවත් එකක් එකතු කළ විට තුනක් වන බවත් නැවත ඉන් එකක් ඉවත් කළ විට ඉතිරි වන්නේ දෙකක් බවට නිවැරදි පිළිතුරු දෙනවාද යන්න සෙවීම.

පර්යේෂණ ප්‍රතිඵල අනුව අඩු වයස් (අවුරුදු හතරයි මාස එකොළහට අඩු)කණ්ඩායමේ සියයට දහහතරකටත් වැඩි වයස් (අවුරුදු හතරයි මාස එකොලළහට වැඩි) කණ්ඩායමේ සියයට තිස් තුනකටත් ද්‍රව්‍ය හයේ පේළි සඳහා සංරක්ෂණ හැකියාව ඇත. ද්‍රව්‍ය තුනේ පේළි සඳහා අඩු වයස් කණ්ඩායමේ සියයට හැත්තෑ තුනකටත් වැඩි වයස් කන්ඩායමේ සියයට අසූ හයකටත් සංරක්‍ෂණ හැකියාව ඇත.

මෙම නියැදියේ ළමුන් අතර ද්‍රව්‍ය හයේ පේළි සමගද සංරක්ෂණය හැකියාව ඇති ළමුන් සිටින බව සඳහන් කළයුතුය. එය නියැදියේ මුළු සංඛ්‍යාවෙන් සියයට විසිතුනකි. ද්‍රව්‍ය තුනේ පේළි සමග සංරක්ෂණ හැකියාව නියැදියේ මුළු සංඛ්‍යාවෙන් සියයට අසූවකි.